**රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදල - 2020**

**------------------------------------------------**

**1.** **මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**1.1** **තත්ත්වාගණනය කළ මතය**

**-------------------------------**

රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2** **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-----------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

-------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ප්‍රමිත අංක 01 හි 01 ඡේදයට පටහැනි ලෙස දණ්ඩන හා රාජසන්තක කිරීමේ ආදායම් මුදල් පදනමට ගිණුම් ගත කර තිබුණි. | අදහස් දක්වා නොමැත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල විය යුතුය. |
| (ආ) ප්‍රමිත අංක 01 හි 128 ඡේදය ප්‍රකාරව මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය හා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ මුහුණතෙහි එක් එක් අයිතමයන්ට අදාල සටහන්වල ඇති සම්බන්ධිත තොරතුරුවලට හරස් යොමු දැක්විය යුතු වුවත්, එසේ කර නොතිබුණි. | මුහුනතෙහි එක් එක් අයිතමයන්හට අදාලව සටහන්වල ඇති සම්බන්ධිත තොරතුරු වලට අදාල සටහන් දක්වා ඇතත් අතපසුවීමකින් සටහන් අංක හරස් යොමු වශයෙන් දක්වා නොමැත. ඉදිරි වර්ෂයන්හි ගිණුම් ඉදිරිපත් කිරීමේදි මෙම අඩුපාඩු නිවැරදි කිරීමට නිලධාරින්හට උපදෙස් දි ඇත. | - එම - |
| (ඇ) ප්‍රමිත අංක 03 හි 54 ඡේදය ප්‍රකාරව පෙර කාලපරිච්ඡේද වැරදි නිවැරදි කරන්නේ නම් එම වරදෙහි ස්වභාවය ආදී කරුණු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කල යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනයේ දක්වා ඇති රු.8,687,637 ක වැරදි නිවැරදි කිරීමේ සටහනට අදාලව ප්‍රමිතිය ප්‍රකාරව හෙළිදරව් කිරීම සිදු කර නොතිබුණි. | නිරීක්ෂණ හා එකඟ වෙමි. අතපසුවීමකින් වැරදි නිවැරදි කිරීමට අදාල විස්තරාත්මක සටහනක් මගින් එය හෙලිදරව් කර නොතිබිණි. | - එම - |

## 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දණ්ඩන හා රාජසන්තක වටිනාකමින් සියයට 50 ක් රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදල වෙත බැර කරනු ලබන අතර එම මුදල, රේගු විමර්ශනවලට දායක වූ ඔත්තුකරුවන් හා රේගු නිලධාරීන් අතරේ බෙදාහැරීම සිදුකරනු ලබයි. අරමුදලට ලැබෙන මුදලින් විවිධ සංචිත සඳහා සුළු ප්‍රතිශතයක් වෙන් කළ ද එක් එක් සංචිත සඳහා වෙන් කෙරෙන වටිනිකම පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. එසේම ත්‍යාග ගෙවීම් සඳහා අරමුදලට ලැබෙන මුදලින් විවිධ කුඩා සංචිත සඳහා ලැබෙන මුදල අරමුදලේ අතිරික්තය ලෙස මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ අවසන් ගිණුම්වල (විස්තීර්ණ ආදායම් ප්‍රකාශය) වියදම ඉක්මවූ ආදායම ලෙස එසේ දක්වා තිබූ මුදල රු.34,143,154 ක් විය. | දණ්ඩන හා රාජසන්තක වටිනාකමින් එම විමර්ශනය සඳහා දරණ ලද වියදම් ඇතොත් එය අඩුකර ඉතිරි මුදලින් 50% රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදලට බැර කෙරුණද එම මුළු වටිනාකම සම්පූර්ණ වශයෙන් ඔත්තුකරුවන් හා රේගු නිලධාරින් අතරේ බෙදා හැරීමක් සිදු නොවේ. විටින් විට රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින නිකුත් කරන ලද දෙපාර්තමේන්තු නියෝග පදනම් කර ගනිමින් ත්‍යාග අරමුදලට බැර කෙරුණු වටිනාකමින් පහත දක්වා ඇති එක් එක් උප අරමුදල් වෙනුවෙන් වෙන් කිරීමක් සිදු වේ. එබැවින් අරමුදල වෙත මාරු කරන මුළු ශේෂයන් බෙදා හැරීමක් සිදු නොවේ.<br>• Fuel fund<br>• Narcotic fund<br>• 2.5% reward fund<br>• Pool payment<br>සෑම වසරකම මේ ආකාරයෙන් උප අරමුදල් වෙත මාරු කරන මුදල් සමුච්චිත වී අරමුදල තුළ පවතී. මේ සම්බන්ධ විස්තර වාර්තාවක් ගිණුමේද ඇතුලත් කර ඇත. ඒ අනුව විගණන නිරීක්ෂනය හා එකඟ නොවෙමි. | ගිණුම්කරන ක්‍රමවේදවලට අනුකූලව ගිණුම් තැබීම. |

## 1.5.3 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට භාණ්ඩාගාර පොත් අනුව අරමුදලේ ශේෂය හා දෙපාර්තමේන්තු පොත් අනුව ශේෂය අතර රු.22,406,445 ක වෙනසක් නිරීක්ෂණය විය. | මෙය පසුගිය වර්ෂ කිහිපයක සිට පැවත එන ශේෂයකි. මේ සම්බන්ධව පරීක්ෂා කොට අවශ්‍ය ගැලපීම් කිරීමට සටහන් කර ගතිමි. | වෙනසට හේතු දක්වමින් සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කිරීම. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 1968 අංක 17 දරන රේගු ආඥා පනතේ 153 (2) (ආ) වගන්තිය | ත්‍යාග අරමුදලින් ත්‍යාග මුදල් බෙදා හැරීම සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබා ගෙන ඒ සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කල යුතු වුවද,1988 ජනවාරි 28 දින අංක පීඑල් 118 දරන දෙපාර්තමේන්තු නියෝගය සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබා ගෙන ඇති බවට තහවුරු කර ගැනීමකින් තොරව 1999 වසරේ සිට 2020 වර්ෂය දක්වා වූ වර්ෂ 22 ක් තුළ ත්‍යාග මුදල් ලෙස නිලධාරීන් සඳහා රු.16,520,215,868 ක්ද, ඔත්තුකරුවන් සඳහා රු.1,997,381,541 ක් ද බෙදා හැර තිබුණි. | ත්‍යාග මුදල් ගෙවීම සම්බන්ධව 1869 අංක 17 දරන රේගු ආඥා පනතේ 153 (2) (ආ) වගන්තියට අනුව ඔබගේ නිරීක්ෂණ සමඟ එකඟ නොවෙමි. 1988 අංක 118 දරන රේගු දෙපාර්තමේන්තු නියෝගය නිකුත් කිරීමේදී අවශ්‍ය අනුමැතිය ලබාගෙන එය නිකුත් කර ඇතැයි යන්න උපකල්පනය කළ හැකි අතර තවදුරටත් මේ සම්බන්ධයෙන් සොයා බැලිය යුතු වේ. ඉදිරි කටයුතු සම්බන්ධයෙන් තීරණයක් ගැනීම මුදල් අමාත්‍යාංශය වෙතින් කමිටුවක් පත්කර ඇත. | අරමුදල් බෙදා හැරීමට සුදුසු ක්‍රමවේදයක් සකස් කිරීම. |

## 2. මෙහෙයුම් සමාලෝචනය

### 2.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) රේගු වැරදි සම්බන්ධව සිදු කරන රේගු විමර්ශනවලදී එම වැරදිවලට අදාලව ආනයනයන් සාමාන්‍ය ක්‍රමයට සිදු කරන ලද ආනයනයන් වූයේ නම් ඒ මත රජයට ලැබිය යුතුව පැවති අවම බදු ආදායමේ ප්‍රමාණය අයකර රාජ්‍ය ආදායමට බැර කිරීම නොසලකා එම අහිමි වූ බදු ආදායම ද දණ්ඩනයක් සේ සලකා එසේ පනවන දණ්ඩන මුදලින් සියයට 50 ක් නිලධාරීන්ට හා ඔත්තුකරුවන්ට ත්‍යාග ගෙවීමට යොදා ගැනීම හේතුවෙන් රාජ්‍ය ආදායමට සිදු කරන අහිතකර බලපෑම පිළිබඳව වර්ෂ ගණනාවක සිට විගණනය විසින් පෙන්වා දී තිබුණි. එහෙත් ඒ පිළිබඳව කිසිදු සොයා බැලීමක් සිදු කර නොතිබුණි. මෙම තත්ත්වය නොසලකා හැරීම නිසා නිලධාරීන් වෙත බෙදාහරින | | |

| | | |
|---|---|---|
| ත්‍යාග මුදල්වල ප්‍රමාණය දිගින් දිගටම වැඩි වීමත් නිරීක්ෂණය වන අතර මේ සම්බන්ධයෙන් වැඩිදුර නිරීක්ෂණ පහත දැක්වේ. | ගැපලෙන අයුරින් රේගු ආඥා පනත සහ අරමුදල්වල නෛතික ප්‍රතිපාදන වරින්වර සංශෝධනය වී ඇති අතර, ඉදිරියේදී ද අදාල පරිදි සංශෝධනය කිරීම පිළිබඳව අවධානය යොමු කරනු ලැබේ. | අවශ්‍ය සංශෝධන සිදු කිරීම. |
| (i) රටේ පවත්නා නිදහස් ආර්ථික ප්‍රතිපත්ති මත ආනයනයන්ගේ හා අපනයනයන්ගේ ඇති වී ඇති සංකීර්ණතාවයට ගැලපෙන අයුරින් රේගු ආඥා පනත මෙන්ම මෙම අරමුදල්වල නෛතික ප්‍රතිපාදන විධිමත්ව හා කාලීනව සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය පැවතිණි. | රේගු ආදායම උපයා ගැනීමේදී රාජ්‍ය ආදායම සුරක්ෂිත කිරීම සඳහා අදාල සියලු පියවරයන් ගැනීමට කටයුතු කරමි. | රාජ්‍ය ආදායම සුරක්ෂිත කිරීම පිළිබඳ අවධානය යොමු කළ යුතුයි. |
| (ii) රේගු ආඥා පනතේ 162 වගන්තියේ දැක්වෙන පරිදි රේගු නියමයන් කඩකිරීම සම්බන්ධයෙන් අදාල වන දෑ පිළිබඳව රේගු අධ්‍යක්ෂවරයාට සුදුසු පරිදි ක්‍රියා කිරීමට බලය පවරා තිබුණි. එහෙත් රාජ්‍ය ආදායම සුරක්ෂිත කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රේගුව විසින් දක්වන අවධානය සතුටුදායක මට්ටමක නොපැවතුණි. | | |
| (ආ) හිඟ දණ්ඩන ආදායම් රැස් කිරීම<br>---------------------------------- | | |
| (i) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවීම හිඟව පැවතුණ නමුත් ගිණුම්ගත නොකරන ලද රු. 2,051,340,784 ක දණ්ඩන ආදායම තුළ වසර 1 ත් 5 ත් අතර රු. 561,540,349 ක් සහ වසර 05 වැඩි රු.182,762,354 ක මුදලක් ඇතුළත් විය. | හිඟ දණ්ඩන ආදායම් රැස්කිරීම විධිමත් කිරීම සඳහා කමිටුවක් පත් කර ඇති අතර ,එම කමිටුව විසින් මෙවන් ගැටළු සඳහා විධිමත් ක්‍රමවේදයක් යෝජනා කර සකස් කරන ලද පසුව ඒවා ක්‍රියාත්මක කිරීමට සටහන් කර ගතිමි . | හිඟ දණ්ඩන ආදායම් ගිණුම්ගත කිරීමට කටයුතු කිරීම. |
| (ii) අංක CINT/HQB018/2013 දරණ රේගු විමර්ශනයට අදාල ගොනුව රු.1,955,942 ක් ගෙවූ පසුව රු.2,212,586 ක මුදලක් ශේෂව තිබියදී අස්ථානගත වී තිබුණි. තවද, අංක ENSP/CASE/2009/09 දරණ රේගු විමර්ශනයට අදාලව හිඟ දණ්ඩන ලෙස විගණිත දිනට රු.350,000 ක ශේෂයක් පැවතියද, මෙම ගොනුවද අස්ථානගත වී තිබුණි. මෙම ගොනු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 103(1) හා 104(1) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධව සොයා බලා වාර්තා කිරීමට සටහන් කර ගතිමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 1968 අංක 17 දරන රේගු ආඥා පනතේ 153 (2) (ආ) වගන්තිය ප්‍රකාරව විවිධ රේගු වැරදි සඳහා පනවනු ලබන දණ්ඩන මුදල් සහ රාජසන්තක කළ භාණ්ඩ විකිණීමෙන් ලැබෙන මුදල්වලින් සියයට 50 කට සමාන මුදල් ප්‍රමාණයක් රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදලට බැර කරනු ලබන අතර, රේගු බදු වංචාවන් අනාවරණය කරගැනීම, පාලනය කිරීම හා වැළැක්වීම වැනි අරමුණු පෙරදැරි කරගෙන නිලධාරීන්ට හා ඔත්තුකරුවන්ට ත්‍යාග ලබාදීම සඳහා මෙම අරමුදල පිහිටුවා තිබේ. 2012 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලය තුළ මෙම අරමුදලින් කරනු ලැබූ ගෙවීම් පිළිබඳ පහත නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (අ) 2012 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා එකතුව රු.මිලියන 12,249 ක මුදලක් නිලධාරීන් හා ඔත්තුකරුවන් අතර බෙදා හැර තිබුණු අතර, මින් රු.මිලියන 10,807 ක් හෙවත් සියයට 88.22 ක් නිලධාරින් වෙත ගෙවා තිබුණි. | විගණන නිරීක්ෂණ හා එකඟ වේ. | අරමුදල් පරිහරණය පිළිබඳ අවධානය යොමු කළ යුතුයි. |
| (ආ) 2012 වර්ෂයේදී නිලධාරීන්ට හා ඔත්තුකරුවන්ට ගෙවූ මුදල රු.මිලියන 787 ක් පමණක් වුවද 2019 වන විට එය රු.මිලියන 1400 ක් දක්වා එනම් සියයට 78 කින් වර්ධනයක් දක්නට ලැබුණි. එමෙන්ම 2020 වර්ෂය තුළ රට තුළ සිදු වූ ආනයන අපනයන සීමා කිරීම, කොවිඩ් 19 වසංගත තත්ත්වය නිසා ආනයන අපනයන වෙළඳාම සැලකිය යුතු අඩු මට්ටමක පැවතිය ද 2020 වර්ෂය තුළදී නිලධාරීන් සඳහා රු.මිලියන 985 ක ත්‍යාග මුදලක් සහ ඔත්තුතරුවන් සඳහා රු.මිලියන 124 ක් ත්‍යාග ලෙස ගෙවා තිබුණි. | 2020 වර්ෂය තුළ ගෙවා ඇති රු.මි. 985 සහ රු.මි.124 ක මුදල 2020 වර්ෂයට අදාල විමර්ශන ගොනු වෙනුවෙන් ගෙවන ලද මුදල් නොවන අතර, එය 2017, 2018 සහ 2019 වර්ෂවලට අදාල විමර්ශන නිමවූ ගොනු සඳහා වේ. තවද, මෙම ත්‍යාග අරමුදලේ එක් මූලික අරමුණක් වන්නේ රේගු වංචාවන් නිවැරදිව හඳුනා ගැනීම හා නිලධාරීන් ඒ සඳහා දිරි ගැන්වීම වේ. එබැවින් මෙම ත්‍යාග යෝජනා ක්‍රමය තුළින් රේගු බදු වංචා අනාවරණය කර ගැනීම සිදු කළද සමස්ථයක් ලෙස එකී වංචාවන් පාලනයක් හෝ අඩු කිරීමක් සිදු කිරීමට ඍජුව හැකියාවක් නොමැත. විශේෂයෙන් ම ඇතිවී තිබෙන පරිගණක හා අනිකුත් තාක්ෂණ දියුණුව උපයෝගී කර ගෙන ඉතා සැලසුම් සහගත ලෙස කණ්ඩායම් වශයෙන් වංචා හා අක්‍රමිකතා සිදු කිරීම සමස්ත වශයෙන් ලෝකය පුරා වර්ධනය වී | - එම - |

| | | |
|---|---|---|
| | ඇති බව නිරීක්ෂණය කෙරේ. ඒ අනුව අප රට තුළද මෙවැනි වංචාකාරී ලෙස මුදල් ඉපැයීමේ ප්‍රවණතාවය වැඩිවීමේ තත්ත්වයක් දක්නට ඇත. එසේම ආනයනකරුවන් අභියාචනා ඉදිරිපත් කිරිමත් අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමත් ප්‍රධාන වශයෙන් විමර්ශන කටයුතු ප්‍රමාදවිමට හේතුවි ඇත. | |
| (ඇ) ත්‍යාග අරමුදලේ උප අරමුදලක් වන ඉන්ධන අරමුදලට සමාලෝචිත වර්ෂයේදී රු.33,528,128 ක් බැර කර තිබුණි. එම අරමුදල පිහිටුවීමේ අරමුණු ලෙස රේගු විමර්ශන සඳහා අවශ්‍ය ඉන්ධන වියදම් පියවා ගැනීම බව දක්වා තිබුණ ද, විමර්ශන කටයුතු සඳහා දරන ඉන්ධන පිරිවැය දෙපාර්තමේන්තුවේ පොදු වැය ශිර්ෂයට වැය බරක් වී තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ එම අරමුදලෙන් කිසිදු වියදමක් දරා නොතිබුණි. එසේ වුවද සාධාරණ අවශ්‍යතාවයන් නොසලකා දිගින් දිගටම මෙම අරමුදලට මුදල් රැස්කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට එහි ශේෂය රු.588,807,229 ක් විය. | නිරීක්ෂණ හා එකඟ වේ. කෙසේ වුවද මෙම ඉන්ධන අරමුදල පිහිටුවීම මූලිකවම අරමුණුකොට ගෙනඇත්තේ රේගු නිවාරණ කටයුතු සඳහා යම් අතිරික්ත ඉන්ධන අවශ්‍යතාවයක් ඇතිවුවහොත් ඒ සඳහා යොදාගැනීමටත්, LTTE යුදමය තත්ත්වය ඇති වීමට පෙර රේගුදෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කළ රේගු නිවාරණ කටයුතු සඳහා යොදා ගන්නා ලද නාවික අංශයෙහි (Marine Unit) ඉන්ධන අවශ්‍යතාවය සපුරා ගැනීමට වේ. පැවති යුදමය වාතාවරණය තුළ මෙම අංශය අක්‍රිය වීම තුළ මෙම අරමුදලේ ශේෂය සමුච්චිත වී ඇත. | - එම - |
| (ඈ) ත්‍යාග අරමුදලේ උප අරමුදලක් වන මත්ද්‍රව්‍ය වැටලීම් සඳහා සහභාගි වන නිලධාරීන් වෙනුවෙන් ගෙවීම් සඳහා වන මත්ද්‍රව්‍ය නිවාරණ අරමුදල (නාකොටික් අරමුදල) වර්ෂය තුළ රු. 9,753,579 ක වර්ධනයක් දක්නට ලද නමුත් වර්ෂය තුළ ගෙවා ඇති මුදල රු.3,414,100 ක් පමණි. | දෙපාර්තමේන්තු චක්‍රලේඛ ප්‍රකාරව මෙම උප අරමුදලට අදාල අරමුදල් මාරු කර ඇති අතර,එසේ මාරු කරන ලද මුදල රු.9,753,579 ක් නොව එය රු.13,167,679.61 ක් ලෙස නිවැරදි විය යුතුය.දෙපාර්තමේන්තු චක්‍රලේඛ පදනම් කොට ගෙන වර්ෂය තුල සිදුකරන ලද ඉල්ලීම් සඳහා අදාල ගෙවීම් සිදු කර ඇත. | - එම - |
| (ඉ) විමර්ශන කටයුතු සඳහා සෘජුව දායක නොවන නමුත් සහායක සේවා සපයන අංශවල නිලධාරීන් සඳහා ගෙවීම් වෙනුවෙන් පිහිටුවා ඇති සියයට 2.5 ක අරමුදල සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.17,908,423 ක් බැරකර තිබූ අතර 2020 දෙසැම්බර් 31 දිනට එම අරමුදලේ ශේෂය රු.182,494,596 ක් විය. | 2020.12.31 ට සියයට 2.5 උප අරමුදලේ ගිණුමෙහි ශේෂය රු. 116,044,277 ක නොව රු. 182,494,596 ක් ලෙස නිවැරදි විය යුතුයි. | - එම - |